උපකුලපති
உப வேந்தர்
Vice - Chancellor } 011 2593397

කාර්යාලය
அலுவலகம்
Office } 011 2580609, 011 2593604, 011 2502942, 011 2502944

Fax : 0094 - 11 - 2580610

# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානය

இலங்கை பௌத்த பாளி பல்கலைக்கழகம்

பட்டப்பின் படிப்பு மற்றும் வெளிவாரி பரீட்சைகள் கற்கை நிலையம்

# BUDDHIST AND PALI UNIVERSITY OF SRI LANKA

Center for Postgraduate Degrees and External Examinations

214, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.
214, பௌத்தாலோக மாவத்தை,
கொழும்பு 07.
214, Bauddhaloka Mawatha,
Colombo 07.

මගේ අංකය / எனது இலக்கம் / My Number } බීපියු/ඊඊ-01/බීඒ/01/Repeat

ඔබේ අංකය / உமது இலக்கம் / Your Number }

2026.02.17

ගරු ස්වාමීන් වහන්ස/ සිල්මාතාවනි/
මහත්මයාණෙනි/ මහත්මියනි/ මෙනෙවියනි,

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර - I පරීක්ෂණය - (නැවත පෙනී සිටින)**
**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර - I පරීක්ෂණය සඳහා සම්මන්ත්‍රණ - 2026 මාර්තු**

උක්ත පරීක්ෂණයට නැවත පෙනී සිටින සිසුන් සඳහා 2026 මාර්තු සහ අප්‍රේල් මස පරීක්ෂණය පැවැත්වෙන අතර ඊට අදාළ සම්මන්ත්‍රණය 2026 මාර්තු මස පැවැත්වීමට සැළසුම් කර ඇත.

මෙම පරීක්ෂණයට හා සම්මන්ත්‍රණ සඳහා සහභාගී වීමට අපේක්ෂා කරන අපේක්ෂකයින්ගෙන් පහත දැක්වෙන පරිදි ගාස්තු ගෙවා ලියාපදිංචි කිරීම සිදුකරනු ලැබේ.

1. **ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර I පරීක්ෂණය සඳහා ලියාපදිංචි වීම හා ඊට අදාළ ගාස්තු ගෙවීම**

2026 වර්ෂයට අදාළව පැවැත්වෙන ඉහත පරීක්ෂණයට ඔබවහන්සේ/ ඔබ නැවත පෙනී සිටීමට බලාපොරොත්තු වන්නේ නම් පහත දැක්වෙන පරිදි ගාස්තු ගෙවිය යුතුය.

| <u>ලියාපදිංචි ගාස්තු</u> (රු.) | <u>අසමත් එක් පත්‍රයක් සඳහා</u> (රු.) |
|---|---|
| 1500.00 | 800.00 |

2. **ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර I පරීක්ෂණයේ සම්මන්ත්‍රණ සඳහා ලියාපදිංචි වීම හා ඊට අදාළ ගාස්තු ගෙවීම**

**සම්මන්ත්‍රණ ගාස්තු -** එක් විෂයක් සඳහා රු: 1000.00 කි.
(එක් විෂය පත්‍රයක් සඳහා රු. 500.00 බැගින්)

**සැ.යු. සම්මන්ත්‍රණ සඳහා සහභාගී වන්නේ නම් පමණක් සම්මන්ත්‍රණ ගාස්තු ගෙවිය යුතු වේ.**

මෙම ගාස්තු ගෙවීම ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් සිදුකළ හැකිය. මෙම මුදල් ලංකා බැංකුවේ හෝමාගම ශාඛාවේ අංක 711202 දරණ රැස්කිරීමේ ගිණුමට බැර කළ යුතු අතර, මුදල් ගෙවීමෙන් අනතුරුව බැංකුව මගින් නිකුත් කරනු ලබන කොළ පැහැති රිසිට්පත අයදුම්පතට ඇමිණිය යුතුය.

නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපැල් මගින් පමණක් පහත ලිපිනයට 2026.03.06 දිනට පෙර එවිය යුතු අතර, ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි " ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර - I පරීක්ෂණය - **(Repeat)** " ලෙස පැහැදිලි ව සඳහන් කළ යුතුය.

සහකාර ලේඛකාධිකාරී
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
214, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

සැයු.

- ★ 2026 මාර්තු මස පරීක්ෂණය පැවැත්වෙන අතර ඉහත උපදෙස් පරිදි ලියාපදිංචි නොවන හා අසම්පූර්ණ අයදුම්පත් එවන අපේක්ෂකයින් මෙන්ම ප්‍රමාද වී අයදුම්පත් යොමු කරන සියලු දෙනාගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඒ පිළිබඳව පසුව කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ.
- ★ අදාළ ගෙවීම් නිසි පරිදි සිදු නොකර එවනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.

ඔබට අදාළ විෂයයන් සඳහා සම්මන්ත්‍රණ පැවැත්වෙන දිනයන් සහිත කාලසටහන 2026.02.27 දිනට ප්‍රථම විශ්විද්‍යාලයීය වෙබ් පිටුවට මුදාහරිනු ඇත.
(http://www.bpu.ac.lk/admissions/external-studies)

එසේම සම්මන්ත්‍රණ කාලසටහන නැවත ඔබට තැපැල් මගින් ලබාදෙනු නොලැබේ.

සහකාර ලේඛකාධිකාරී
(පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග)
ලේඛකාධිකාරී වෙනුවට